සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය II
கிறிஸ்தவ நாகரிகம் II
Christian Civilization II

49 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස් :

※ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) පෘතුගීසින් විසින් ශ්‍රී ලංකාවේ වේදිකාගත කරන ලද නාට්‍ය **හතරක්** ලැයිස්තුගත කරන්න. (ලකුණු 2යි)

(ii) ශ්‍රී ලංකාවේ සේවය කරන ලද ක්‍රිස්තියානි අධ්‍යාපනඥයින් **දෙදෙනෙකුගේ** දායකත්වය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 4යි)

(iii) පෘතුගීසි යුගයේ දී ශ්‍රී ලංකාවේ සේවය කළ ෆ්‍රැන්සිස්කාන නිකායික මිෂනාරිවරුන් විසින් පවත්වාගෙන යන ලද පාසල් වර්ග විස්තර කරන්න. (ලකුණු 6යි)

(iv) ශ්‍රී ලංකාව නිදහස ලැබීමෙන් පසු කිතුනුවන් විසින් සිදුකරන ලද සමාජ සේවා **දෙකක්** සාකච්ඡා කරන්න. (ලකුණු 8යි)

2. (i) වෙදහෙද මගින් ශුද්ධ වූ සභාවට ලැබුණු හිතකර ප්‍රතිඵල **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 2යි)

(ii) කුරුස යුද්ධ දියත් කිරීමට බලපෑ හේතු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 4යි)

(iii) කුරුසියේ සාන්ත ජොහාන්තුමන් විසින් ක්‍රිස්තියානි අධ්‍යාත්මිකත්වයට දැක්වූ දායකත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 6යි)

(iv) මුල් සියවස් පහ තුළ දී ශුද්ධ වූ සභාවේ විශ්වීය බව අනාවරණය වූ ඓතිහාසික සිදුවීම් **හතරක්** සාකච්ඡා කරන්න. (ලකුණු 8යි)

3. (i) මුල් කිතුනු සංඝයේ ලක්ෂණ **හතරක්** නම් කරන්න. (ලකුණු 2යි)

(ii) ශුද්ධ වූ පේදුරුතුමාගේ පළමු දේශනාවේ අඩංගු වූ මූලික කරුණු සඳහන් කරන්න. (ලකුණු 4යි)

(iii) 'ශුද්ධාත්මයාණන් තුළ ජීවිතය' පිළිබඳ පාවුලුතුමාගේ ඉගැන්වීම් සාකච්ඡා කරන්න. (ලකුණු 6යි)

(iv) ක්‍රිස්තියානි ධර්මයේ අභිවෘද්ධියට ග්‍රීක-රෝම සංස්කෘතිය දායකත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 8යි)

[දෙවැනි පිටුව බලන්න.

## II කොටස

4\. (i) ක්‍රි.ව. පළමුවන සියවසේ පලස්තීන සමාජය මගින් කොන් කරන ලද පව්කරුවන්, අයබදු අය කරන්නන් හා සමාරිතානුවරුන් පිළිබඳ ජේසුන්වහන්සේ දැක්වූ ආකල්පය විස්තර කරන්න.

(ii) 'ශ්‍රාවකත්වය' පිළිබඳ ජේසුන්වහන්සේගේ ඉගැන්වීම් වත්මන් ජන සමාජයට අදාළ වන ආකාරය විමසන්න. (ලකුණු 10 × 2 = 20 යි)

5\. (i) ශුද්ධ වූ පාවුලුතුමාගේ ධර්මදූත ගමන් සහ ලිපි, කිතුනු ධර්මයේ ව්‍යාප්තියට මහත් රුකුලක් වූ ආකාරය සාකච්ඡා කරන්න.

(ii) කොවිඩ් - 19 (COVID - 19) වසංගත තත්ත්වය හමුවේ, ලාංකේය කිතුනු සභා විසින් කිතුනු විශ්වාසය නගාලීමට ගත් පියවර අගයන්න. (ලකුණු 10 × 2 = 20 යි)

6\. (i) මිලාන් අඥාව නිසා ඇති වූ යහපත් සහ අයහපත් ප්‍රතිඵල විස්තර කරන්න.

(ii) "දේශයක පූර්ණ සංවර්ධනය සඳහා විවිධ ආගම් සහ ජාතීන් අතර සහයෝගීතාව මහඟු රුකුලකි." මෙම ප්‍රකාශය විමසන්න. (ලකුණු 10 × 2 = 20 යි)

7\. (i) කැපුචින් පැවිදිවරුන්ගේ ජීවිත ක්‍රමය තුළ කැපී පෙනෙන ලක්ෂණ විස්තර කරන්න.

(ii) ගිහියා තුළ පූර්ණ වර්ධනයක් ඇති කිරීමෙහිලා පූජකවරුන්ට හා පැවිදිවරුන්ට දායක විය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10 × 2 = 20 යි)

8\. (i) ලන්දේසි යුගයේ දී ශ්‍රී ලංකාවේ මනා ලෙස ගොඩනැගුණු අධ්‍යාපන ක්‍රමයක් පවත්වාගෙන යන ලද්දේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ii) "ලන්දේසි මිෂනාරිවරුන් විසින් මනා ලෙස ගොඩනගන ලද අධ්‍යාපන ක්‍රමයක් මගින් ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි දහම පැතිරිණි." මෙම ප්‍රකාශය සනාථ කරන්න. (ලකුණු 10 × 2 = 20 යි)

***